# විදුලි කාර්මික තනතුර

**ශ්‍රී ලාංකීය මුද්‍රිත මාධ්‍යයේ මහගෙදර සහ හදවත ලෙස ප්‍රසිද්ධියක් උසුළන ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ANCL) විසින් විදුලි කාර්මිකයෙකු ලෙස ප්‍රධාන කාර්යයක් ඉටුකිරීම සඳහා පළපුරුදු අයදුම්කරුවන්ට ආරාධනා කරනු ලැබේ**

**විදුලි කාර්මික පසුබිමක් සහිත විශිෂ්ට දැනුමක් ඇති දක්ෂ, ක්‍රියාශීලී අයවලුන් අප විසින් සොයනු ලැබේ**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

- විද්‍යාව හා ගණිතය ඇතුළුව අපොස (සා/පෙළ) විෂයයන් හයකින් සමත්වීම.
- පූර්ණ කාලීන විදුලි කාර්මික සහතික පත්‍ර පාඨමාලාවක් සමග වසර 05 ක විදුලි කාර්මික සේවා පළපුරුද්ද.

**ප්‍රධාන වගකීම් :**

- නව විදුලි ව්‍යාපෘතිවලට සහාය ලබාදීම, මුද්‍රණ යන්ත්‍රවල අක්‍රිය තත්ත්වයෙන් තිබෙන වේලාව අවමය කිරීම, පත්‍ර පිටකිරීමේ අංශයේ විදුලි උපකරණ හා අනෙකුත් සියලුම විදුලි අයිතම්වල අක්‍රියතාවය අවමය කිරීම සහ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සියලුම විදුලි පද්ධති සහ යන්ත්‍ර මෘදු ලෙස ක්‍රියාකිරීම සඳහා සහාය ලබාදීම.
- විදුලිජනක යන්ත්‍ර සහ උප යන්ත්‍රාගාර කාමරයේ නඩත්තුව.

**වයස :** අවුරුදු 45 ට අඩු විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයන්ට සිත් ඇදගන්නා සුළු වැටුප් පැකේජයක් ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ජීව දත්ත, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා සම්බන්ධ කරගත හැකි විස්තර සහිතව මෙම දැන්වීම පළ කල දිනයේ සිට දින හතක් ඇතුලත ඔබේ අයදුම්පත කරුණාකර යොමු කරන්න. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **අයදුම්කරන තනතුර** සඳහන් කර පහත සඳහන් ලිපිනයට යොමු කිරීමට හෝ විෂය තිරුවේ "විදුලි කාර්මික තනතුර" යනුවෙන් සඳහන් කර පහත සඳහන් ඊමේල් ලිපිනය වෙත ඊමේල් මගින් යොමු කිරීමට හැකිය.


LAKE HOUSE

**ප්‍රධානී - මානව ප්‍රාග්ධන,**

**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,**

**අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.**

**dgm.hc@lakehouse.lk**